ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන -2023/2024
5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
**SNU5535/ESU3235 - විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා මනෝ විද්‍යාව**
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2025.01.18 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

01 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 01 වන කොටස

01. අන්තර්කරණ පන්ති කාමරයක දුබලතා සහිත සිසුන් සමඟ වැඩ කරන ගුරුවරයෙකුට අධ්‍යාපනික මනෝවිද්‍යාවේ ප්‍රතිලාභ කෙටියෙන් පැහැදිලි කරන්න.

02. අන්තර්කරණ පන්ති කාමරයක ඉගෙන ගන්නා සිසුන්ගේ විවිධ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා අධ්‍යාපනික මනෝවිද්‍යාවේ දැනුම සහ කුසලතා භාවිතා කිරීමේදී ඔබ මුහුණ දෙන අභියෝග මොනවාද?

03. බුද්ධිමය දුබලතා සහිත සිසුන් දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම් සිදුකිරීමේදී මුහුණ දෙන අභියෝග මොනවාද? සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

04. ඔටිසම් පාරාසයික ආබාධ සහිත සිසුන්ගේ සංවර්ධනය සඳහා පාරිසරික සාධකවල බලපෑම උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

05. "පරිණතිය" යන යෙදුම පැහැදිලි කර විශේෂ අධයාපන අවශ්‍යතා ඇති සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට "පරිණතිය" බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

06. ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියට දුබලතා සහිත නව යොවුන් වියේ පසුවන්නන් සමෝධානිත කිරිමේදී ඔවුන් මුහුණ දෙන අභියෝග උදාහරණ සමඟින් සාකච්ඡා කරන්න.

07. අන්තර්කරණ පන්ති කාමරයක ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ඔබ විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති සිසුන්ගේ පෙළඹවීම සිදු කරන්නේ කෙසේද? උපාය මාර්ග **පහක් (05)** සඳහන් කරන්න.

08. සංවේදන ඌණතා සහිත දරුවන් තොරතුරු සැකසුම් ක්‍රියාවලිය තුළදී මුහුණ දෙන අභියෝග උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05x08=40)



03

## 02 – කොටස

09. (i.) තොරතුරු සැකසුම් ආකෘතියේ ප්‍රධාන පියවර දක්වන්න. (ලකුණු 06)

(ii.) දුබලතා සහිත සිසුන්ගේ ඉගෙනීමේ ක්‍රියාවලිය සඳහා තොරතුරු සැකසුම් ආකෘතිය යොදාගැනීමේ දී අන්තර්කරණ පන්ති කාමරයක ගුරුවරයෙකු මුහුණ දෙන අභියෝග අවම වශයෙන් **පහක් (05)** විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී දුබලතා සහිත සිසුන්ගේ අවධානය පවත්වා ගැනීමට ඔබට භාවිතා කළ හැකි උපාය මාර්ග **පහක් (05)** පැහැදිලි කරන්න.
(ලකුණු 08)

10. (i.) පර්යේෂණාත්මක ළමා අධ්‍යයන ක්‍රම සහ පර්යේෂණාත්මක නොවන ළමා අධ්‍යයන ක්‍රම අතර, වෙනස්කම් අවම වශයෙන් **හතරක් (04)** සඳහන් කරන්න.
(ලකුණු 06)

(ii.) දුබලතා සහිත දරුවෙකු පිළිබඳ විමර්ශනය කිරීම සඳහා සුදුසු ළමා අධ්‍යයන ක්‍රමයක් තෝරා ඔබ එම ළමා අධ්‍යයන ක්‍රමය තෝරා ගැනීම සාධාරණීකරණය කරන්න.
(ලකුණු 06)

(iii.) දුබලතා සහිත දරුවාගේ හැසිරීම අධ්‍යයනය කිරීම සඳහා ඉහත සඳහන් කළ ළමා අධ්‍යයන ක්‍රමය ඔබ යොදා ගන්නේ කෙසේදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
(ලකුණු 08)

11. (i.) බී.එෆ්. ස්කිනර් විසින් යෝජනා කරන ලද උපස්ථම්භන න්‍යාය හි මූලධර්ම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) අන්තර්කරණ පන්ති කාමරයක් තුළ ඔබ උපස්ථම්භන න්‍යායේ උපාය මාර්ග භාවිතා කරන්නේ කෙසේදැයි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 06)

(iii.) විශේෂ අධ්‍යාපන ඒකකයක විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ගේ ස්වයංනියාමන ඉගෙනුම සංවර්ධනය සඳහා ප්‍රකම ඉගෙනුම් (පියවර පාඩම් ක්‍රමය) ක්‍රමයේ ප්‍රතිලාභ **තුනක් (03)** සාකච්ඡා කරන්න.
(ලකුණු 08)

12. (i.) අන්තර්කරණ පන්ති කාමරයක උගන්වන ගුරුවරයෙකු පෙළඹවීම් න්‍යායන් පිළිබඳව දැනගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) මාස්ලෝ විසින් යෝජනා කරන ලද පෙළඹවීම් න්‍යාය පැහැදිලි කරන්න.
(ලකුණු 06)



04

(iii.) "මාස්ලෝගේ න්‍යාය දුබලතා සහිත සිසුන්ට එලෙසම අදාළකරගත නොහැක" උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශය පරීක්ෂා කරන්න.

(ලකුණු 08)

13. (i.) පිළිගත් නිවර්චන දෙකක් **(02)** භාවිතයෙන් 'පෞරුෂය'යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන් තුළ සමබර පෞරුෂයක් වර්ධනය කිරීමේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) ශ්‍රී ලංකාවේ පාසල් වල විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන් තුළ සමබර පෞරුෂයක් සංවර්ධනය කිරීමේදී ගුරුවරුන් මුහුණ දෙන අභියෝග පැහැදිලි කරන්න.

(ලකුණු 08)

14. (i.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් තුළ සුදුසු සමාජ සහ චිත්තවේගී හැසිරීම් සංවර්ධනය කිරීමේදී අන්තර්කරණ ගුරුවරුන්ගේ කාර්යභාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් තුළ සුදුසු සමාජ සහ චිත්තවේගී හැසිරීම් සංවර්ධනය කිරීම සඳහා ගුරුවරයෙකු ලෙස ඔබට ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) ඔබේ පාසල්වල විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති සිසුන් අතර සුදුසු සමාජ සහ චිත්තවේගී හැසිරීම් සංවර්ධනය කිරීමේදී ඔබ මුහුණ දෙන අභියෝග හතරක් **(04)** විභාග කරන්න.

(ලකුණු 08)

\- සියලුම හිමිකම් ඇවිරිණි. -